# වැඩි මනාප ඡන්ද පදනම මත ඇමතිකම් පිරිණැමීම නො කළ යුත්තකි





ලීලසේන දේවරාජ

2013-01-28 දා ශ්‍රී ලංකාවේ සිදු කෙරුණු ඇමති මණ්ඩල සංශෝධනයේ දී ගාල්ලට අසාධාරණයක් සිදු වී ඇති බවත් ඊළඟට සිදු කෙරෙන ඇමති මණ්ඩල සංශෝධනයේ දී එම අසාධාරණය ඉවත් කෙරෙනු ඇතැයි තමා බලාපොරොත්තු වන බවත් පසු ගිය දා දකුණු පළාතේ එක්තරා දේශපාලනඥයකු කළ ප්‍රකාශයක් ඉකුත් දා ශ්‍රී ලංකාවේ සියලුම පුවත්පත්වල පළ ව තිබිණි. දකුණු පළාතට අසාධාරණයක් සිදුවී ඇති නම් එසේ අසාධාරණයට ලක්ව සටින අයට තම දුක්ගැනවිල්ල ගැන කීමට සාධාරණ අයිතියක් ඇති නිසා ඒ පිළිබඳව යමක් කීමට මා අපේක්ෂා නොකරන අතර මගේ අදහස ප්‍රකාශ කරනුයේ ගාල්ලට සිදු වී ඇතැයි කියන අසාධාරණය සම්බන්ධව මෙම දේශපාලනඥයා සඳහන් කර ඇති ඊළඟ කරුන සම්බන්ධවයිග ඔහු සඳහන් කරනුයේ ඇමති ධූර ප්‍රදානය කිරීම් දී දිස්ත්‍රික්කයේ වැඩිම ඡන්ද ලබා ඇති මන්ත්‍රීවරයාට ඇමති ධූරයක් පරිණැමීමක් සිදු නොවීම අසාධාරණයක් බව ය. අපේ බොහෝ දේශපාලනඥයන් දරණ මේ මතය රටේ සංවර්ධනයට මෙන් ම රටේ යහ පැවැත්මට ද හානිකර බව ප්‍රස්තුත කාරණය විශ්ලේෂණාත්මකව බලන ඕනෑම අයෙකුට පැහැදිලි වනු ඇත.

රටක ඇමති මණ්ඩලය උගත්, බුද්ධිමත්, කෘතහස්ත දේශපාලනඥයන් ගෙන් සමන්විත වෙතොත් එය ඒ රටේ සංවර්ධනයටත් රටේ යහ පැවැත්මටත් එක සේ ඉවහල් වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. එම නිසා ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයේ ඇති රටක රාජ්‍ය පාලකයා අගමැති වුවද ජනාධිපති වුව ද තම ඇමති මණ්ඩලය හෙවත් කැබිනෙට්ටුව ඉහත සඳහන් ගුණාංගවලින් සපිරි පුද්ගලයන් ගෙන් සමන්විත කරගැනීම පිළිබඳ අභිමතානුසාරී බලය ඔහුට/ඇයට තිබිය යුතු ය. ඒ අනුව ජනතාව විසින් තම රටේ අනාගතය යහපත් කර ගැනීම අරභයා තමා වෙත තබා ඇති බලාපොරොත්තුව යථාර්ථයක් බවට පත්කරගත හැක්කේ කවර කවර මන්ත්‍රීවරුන් තම කැබිනට් මණ්ඩලයට ඇතුලත් කරගැනීමෙන් දැයි තීරණය කිරීම රාජ්‍ය පාලකයා ගේ වගකීම වන්නේ ය. එහි දී ඒ ඒ ඇමතිධූර පවරනු ලබන මන්ත්‍රීවරයා සතු උගත්කම, බුද්ධිමත් භාවය, කෘතහස්ථභාවය, නිවැරදි තීරණ ගැනීමේ හැකියාව වැනි ගුණාංග රාශියක් පිළිබඳව රාජ්‍ය පාලකයා විසින් සලකා බැලිය යුතු වන්නේ ය. වැඩිම මනාප ලබා ඇති පුද්ගලයා එකී කිසිදු ගුණාංගයක් නැති අයෙකු නම් හුදෙක් වැඩි මනාප ගැන පමණක් සලකා බලා ඔහුට ඇමති පදවියක් පිරිණැමීම අසාධාරණයක් පමණක් නොව ජාතික වශයෙන් සලකා බලන විට අපරාධයක් යැයි කිවයුතුය.

> ***ඇමතිවරයා විසින් ගනු ලබන එකී අදූරදර්ශී තීරණය නිසා රටේ මුලුමහත් ජනතාව අවුරුදු ගණනාවක් වන්දි ගෙවන තත්ත්වයක් උදාවිය හැකිය. ඉතිහාසය ඒ බව ඔප්පු කර ඇත්තේ වරක් දෙවරක් නොවේ***

ඇමතිවරයෙකු යනු දෙපාර්තමේන්තු ගණනාවක්, රාජ්‍ය සංස්ථා කිහිපයක් පාලනය කරනු ලබන, ඒවා නියමානුකූලව මෙහෙයවීමේ වගකීම පැවැරෙන ආයතනය වන අමාත්‍යංශය භාර දේශපාලන බලධාරියා වන්නේ ය. ඔහු සතු අඩු අත්දැකීම නිසා හෝ පළල් දැක්මක් නැතිකම නිසා හෝ ගනු ලබන වැරදි තීරණයක් හේතු කොටගෙන රටේ ආර්ථිකයට විශාල හානියක් සිදු විය හැකි ය. ඇමතිවරයා විසින් ගනු ලබන එකී අදූරදර්ශී තීරණය නිසා රටේ මුලුමහත් ජනතාව අවුරුදු ගණනාවක් වන්දි ගෙවන තත්ත්වයක් උදාවිය හැකිය. ඉතිහාසය ඒ බව ඔප්පු කර ඇත්තේ වරක් දෙවරක් නොවේ එම නිසා වැඩි මනාප ලබාගැනීමම ඇමති පදවියක් පිරිණැමීමට සුදුසුකමක් නොවිය යුතු අතර තමා වැඩි මනාප ප්‍රමාණයක් ලබා ඇති නිසාම තමාට ඇමතිධූරයක් හිමිවිය යුතු යැයි අදිඅපේක්ෂාවක් ඇති කරගන එය නො ලැබුණ විට අපෙක්ෂා භංගත්වයට පත් වී නෝක්කඩු කීම ද ජනතා හිතවාදී දේශපාලකයන් නො කළ යුත්තකි. රටේ ජනතාව ද මේ යථාර්ථය හරියාකාරව තේරුම් ගැනීම රටට වැඩදායක වනු ඇත.

අපේ වැනි රටවල සර්ව ජන ඡන්ද ක්‍රමය ක්‍රියාත්මක වන අන්දම අනුව මැතිවරණයක දී ජයගැනිමට මුලින් සඳහන් කළ සුදුසුකම්වලට වඩා බලපාන වෙනත් හේතු ගණනාවක් ඇත. තමන් ගේ කම හෙවත් තම කුලයේ අයෙකු වීම, තම ආගමේ අයකු වීම, වැඩිපුර විසි කරන්නට සල්ලි ඇති අයෙකු වීම පමණක් නොව, මැර බලය ප්‍රදර්ශනය කළ හැකි අයෙකු වීම හෝ එහි ලා යොදවාගත හැකි සහචරයන් හෙවත් සපෝටර්ලා පිරිසක් සිටීම ද වැඩි ඡන්ද ප්‍රමාණයක් ලබාගැනිමට ඉවහල් වන බව අතීත ඡන්ද ප්‍රතිඵල විශ්ලේෂණාත්මකව නිරීක්ෂණය කරන කෙනෙකුට පෙනී යනු ඇත. අල්ලස් කොමිෂමක් මගින් අල්ලස් ගැනීමේ වරදකරු ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබ සිටියදීත් 1960 මාරතු නැතිනම් ජූනි මැතිවරණ දෙකකින් එකක දී වයඹ පළාතේ එක් සත්පුරුෂයෙකු ජනතාව ගේ වැඩි ඡන්දයෙන් පාර්ලිමේන්තුවට තේරී පත් වූ බව මෙහි ලා දැක්වීය හැකි හොඳ නිදර්ශනයකි. මෙහි ඇති වැදගත්ම සිද්දිය වනුයේ මේ පින්වතා අල්ලස් ගැනිමේ වරදකරු බව අල්ලස් කොමිෂම තීන්දු කරන ලද්දේ මැතිවරණ ව්‍යාපාරය පැවැත්වීමට ආසන්න කාලවකවානුව තුල දී වී තිබිය දීත් ඔහු වැඩි ඡන්දයෙන් තෝරා පත් කරගැනීමට තරම් ඔහුගේ ඡන්ද දායකයන් "ගුණගරුක බුද්ධිමත්" පිරිසක් වීම ය. සර්ව ජන ඡන්ද ක්‍රමය යටතේ නුසුදුස්සන් තේරී පත්වන හැටි මෙයින් පැහැදිලි වන අතර සුදුස්සනට තැන නොලැබෙන ආකාරය දැක්වීමට නිදසුන් දෙකක් පමණක් දක්වනු රිසියෙමි.

යටත් විජිත සමයේ ලංකාවේ සිදු කරන ලද විශාලම සමාජ විප්ලවය සේ සැලකෙන නිදහස් අධ්‍යාපනය රටට දායාද කළ "නිදහස් අධ්‍යාපනයේ පියා" යන විරුදාවලියෙන් අදත් පිදුම් ලබන, සමස්ත ලංකා මධ්‍ය විද්‍යාලයීය ආදී ශිෂ්‍ය සංගමය මගින් වාර්ෂිකව අනුස්මරණය කෙරෙන, රාජ්‍යමන්ත්‍රණ සභා අධ්‍යාපන අමාත්‍ය සී.ඩබ්.ඩබ්. කන්නංගර මහතා 1947 පැවැති ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයෙන් පරාද විය. යටත් විජිත සමයේ පාරම්පරික උරුමයක් වන තරමට දොස්තර, ඉංජිනේරු, නීතිඥ වැනි වෘත්තීන් ඉංගිරිසි කතා කරන ප්‍රභූ පංතියේ දරුවනට සීමාවී තිබුණ අතර ගමේ ගොඩේ දරුවන් මොන තරම් සහජ කුසලතා ඇති අය වුවද ඔවුනට ඉහත දැක්වූ වෘත්තියකට පිවිසිය හැකි වාතාවරණයක් එදා නො වීය. නීතිඥයකු වීමේ හිමිකම ප්‍රභූ පංතියේ දරුවනට හිමි වූ අතර සාමාන්‍ය පංතියේ දරුවකුට නීතිඥ ලිපිකරුවකු වීමෙන් තෘප්තිමත් විය යුතු සමාජයක, එදා පැවැතියේ. එකී වැඩවසම් සමාජ ක්‍රමය අනාගතයේ අහෝසි වී යන පරිදි ගමේ ගොවියා ගේ පුතාටත් වත්තේ කිරි කපන කාන්තාවගේ පුතාටත් අනාගතයේ දොස්තර කෙනකු, නීතිඥයකු වන්නට මග පෑදෙන පරිදි නිදහස් අධ්‍යාපනය බිහිකළ කන්නංගර මහතා දේශපාලනඥයකු වශයෙන් නිකැළැල්, සාධු චරිතයක් ඇති අයෙකු වූව ද ප්‍රථම පාර්ලිමේන්තු මැතිවරණයේ දී මතුගම ආසනයෙන් එතුමා පරාජය විය. එතුමා ගේ පරාජය ගැන කලක් යන තුරු දීවයිනේ නොයෙකුත් පොදුජන රැස්වීම්වල දී සාමාන්‍ය ජනතාව, විශේෂයෙන් මහා සංඝරත්නය තම සංවේගය, කම්පාව පළ කළ හැටි ඒ කාලවකවානුවේ පුවත් පත් පෙරළා බලන අයෙකුට පැහැදිලිව බලාගත හැකි ය.

මීට අදාළව තවත් හොඳ නිදර්ශනයක් වත්මන් පාර්ලිමේන්තුව තුලින් ද දැක්විය හැකි ය. දේශපාලන පක්ෂ භේදයෙන් තොරව වත්මන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවෙ සිටින මන්ත්‍රීවරුන් ගේ උගත්කම, බුද්දිමත්භාවය, කෘතහස්ථභාවය, ජාත්‍යන්තර අවබෝධය යනාදී ගුණාංග වලට ලකුණු දෙන වැඩපිළිවෙලක් ක්‍රියාත්මක වෙතොත් වත්මන් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහජන ඡන්දයෙන් පත් ව සිටින මන්ත්‍රීවරුන් අතුරින් වැඩිම ලකුණු ප්‍රමාණයක් හිමිවිය යුතු පුද්ගලයා ආචාර්ය සරත් අමුණුගම බව අවිවාදිත ය. ට්‍රිනිටි විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය ලැබ, පේරාදෙණි සරසවියෙන් පන්ති සාමර්ථ්‍යයක් සහතව උපාධිය සපුරා, අඩු වයසෙන් පරිපාලන සේවයට පිවිස, දෙපාර්තමේන්තු ප්‍රධානියකු වශයෙන් ද අමාත්‍යංශ ලේකම්වරයකු, රාජ්‍ය සංස්ථා සභාපතිවරයකු වශයෙන් දශක තුනකට වැඩි කාලයක් රාජ්‍ය සේවයේ ඉහළ තලයේ විවිධ වගකීම් දරා කෘතහස්තභාවයක් ඇති සරත් අමුණුගම මහතා පෙර-පර දෙදිග සම්භාව්‍ය සාහිත්‍ය, කලා පිළිබඳ පෘථුල අවබෝධයක් ඇති, දේශපාලන විද්‍යාව, සමාජ විද්‍යව වැනි ගැඹුරු විශයයන් පිළිබඳ පුළුල් දැනුමක් ඇති කුශාග්‍ර බුද්ධිමතෙකු මෙන් ම විද්වත් විචාරකයකු ද පීඑච්ඩී උපාදිධාරියකු ද වන අතර ජාත්‍යන්තර සංවිධානවල වගකිවයුතු තනතුරු උසුලා අත්දැකීම් ඇති අයෙක් ද වේ. මෙකී සියලු ගුණාංගවලින් පරිපූරිත අන් එකද අයෙකු වත් වත්මන් පාර්ලිමේන්තුවේ නැතැයි කීම කිසිවකු අවතක්සේරු කිරීමක් නොව යථාර්ථය ඇති සැටියේ දැක්වීමක් පමණිග

ඇති තතු එසේ වුව ද පසුගිය මැතිවරණයේ මහනුවර දිස්ත්‍රික්කය සඳහා තෝරාගනු ලැබූ මන්ත්‍රීවරුන් හතර දෙනා ලබා ඇති ඡන්ද ගණන අනුව ආචාර්ය අමුණුගම තේරී ඇත්තේ හතරවන තැනට ය. මේ තමා ශ්‍රී ලංකාවේ සර්ව ජන ඡන්දය ක්‍රියාත්මක වන ආකාරය. මෙවන් තත්ත්වයක් පවතිද්දී හුදෙක් මැතිවරයේ දී ලබාගත් ඡන්ද අනුපාතය පදනම් කරගන ඇමතිකම් පිරිණැමීම රටේ අනාගතය ගැන හිතන කිසිදු පුරවැසියකුට අනුමත කළ හැකියැයි මම විශ්වාස නොකරමි. තම ඇමති මණ්ඩලය සමන්විය යුත්තේ කෙසේ ද ඒ අනුව ඒ ඒ ඇමති ධූරය සඳහා පත් කරගත යුත්තේ කවර කවර මන්ත්‍රීවරයා ද යන්න තීරණය කිරිමේ අභිමතානුසාරී බලය රාජ්‍ය පාලකයා සතු අනභියෝගී වගකීමක් විය යුතු ය.

Rashmideva @ hotmail.com
පොයින්ට් කුක්

**LEARN JAPANESE**

By a Qualified Experienced Teacher
(Northern Suburbs).

**PREP to VCE**
**Help in essay writing, exam tips, conduct mock tests and preparation for VCE oral exam.**

Individual classes for reasonable rates.

**Contact: 0425396975**